මගේ අංකය - 3/5/2 – I

චක්‍රලේඛ අංක - 08/2016

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23
දුම්රියපොළ පාර
බම්බලපිටිය.
2016.08. 22

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,
සහ ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත

**<u>රාජකාරියෙහි යෙදී සිටිය දී තමාගේ වරදක් නොමැතිව සිදුවන අනතුරු හේතුවෙන් මියයන සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ අවමංගල්‍ය වියදම් දීමනාව සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ හා සම්බන්ධ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ආයතන අධයක්ෂ ජනරාල්ගේ අංක EST/7/ALLOW/03/2007 හා 2016.08.01 දිනැති සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/CIS/10/CSD/WELF හා 2016.08.15 දිනැති ලිපි හා බැඳේ.

02. ඒ අනුව තමාගේ වරදක් නොමැතිව රාජකාරියෙහි යෙදී සිටියදී සිදුවන අනතුරු නිසා මරණයට පත්වන සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා ලබා දෙන අවමංගල්‍ය දීමනාවන් 2016.08.01 දින සිට පහත පරිදි සංශෝධනය වන බව දන්වා සිටිමි.

| ගෙවීම් පිළිබඳ විස්තරය | 2006.10.09 දින සිට 2016.07.31 දක්වා අවමංගල්‍ය දීමනාව (සංශෝධනයට පෙර) | 2016.08.01 සිට ඉදිරියට අවමංගල්‍ය දීමනාව (සංශෝධනයට පසු) |
|---|---|---|
| දේහය සැකසීම, හොඳ තත්වයේ පෙට්ටියක් සැපයීම සහ අනෙකුත් උපාංග සමග දේහය මල් ශාලාවේ සිට කි.මී.20 ක දුර ප්‍රමාණයක් තුළ නිවසට ගෙන ගොස් භාර දීම. | රු.11,000.00 | රු.34,500.00 |
| දේහය මල් ශාලාවේ සිට නිවසට ප්‍රවාහනය කිරීමේදී ඇති දුර ප්‍රමාණට කි.මී.20 ට වැඩි වන සෑම අවස්ථාවකදීම නිවසට යාමට හා ඒමට ඇති මුළු දුර ප්‍රමාණය ප්‍රවාහනය කිරීම සඳහා කි.මී. 01 කට. | රු.30.00 | රු.75.00 |

03. මීට අදාල ඉදිරි ගෙවීම් කටයුතු සංශෝධිත උක්ත දීමනා අනුව සිදු කල යුතු බැව් වැඩිදුරටත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත - ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය